**සේරුවිල ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සේරුවිල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 අනුකූල නොවීම්

### 1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතී, රීතී. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 24වගන්තිය | සභාව විසින් ඉදිකිරීම් කරන ලද මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර තිබුණ අතර එම මාර්ග සියල්ල ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග සියල්ල ගැසට් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 126 වගන්තිය | සභාව තුළ නව ආදායම් උත්පාදනය කළ හැකි පරිදි අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ඉදිරියේදී නව ආදායම් මාර්ග උත්පාදනය කළ හැකි අතුරු ව්‍යවස්ථා සම්පාදනයට අවශ්‍ය කටයුතු කරන බව | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 134 වගන්තිය | සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු කර නොතිබුණි. | ඒ සඳහා අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව | - එම - |
| (ආ) | 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/5 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් පළ කරන ලද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | (i) 59 වැනි රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේදී සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර වෙළඳ බලපත්‍ර ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 218 වැනි රීතිය | පිරිවැය රු.135,817,830 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය සඳහා ඉදිරියේදී කටයුතු කරන බව | - එම - |
| (ඇ) | 1980 අංක 47 දරණ ජාතික පරිසර පතන හා 2008 පෙබරවාරි 25 දිනැති අංක 1533/16 දරණ ගැසට් පත්‍රයේ විධිවිධාන | වලංගු පරිසර බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථා පැවතුණි. | බලපත්‍ර ලබානොගත් ආයතන සඳහා අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව | ජාතික පරිසර පනත හා ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 04/1994 හා 1994 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය | සෑම මාණ්ඩලික නිලධාරියෙකු විසින් වාර්ෂිකව තම වත්කම් හා බැරකම් ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව | චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද ප්‍රකාශන අනුව දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන 31 දෙසැම්බර් 2023 වියදම ඉක්ම වූ ආදායමරු 10,082,224.ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 2,803,721.ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 5,646 | 7,093 | 6,923 | 1,033 | 5,346 | 3,819 | 2,956 | 863 |
| බලපත්‍ර ගාස්තු | 845 | 717 | 717 | - | 695 | 706 | 706 | - |
| වෙනත් ආදායම් | 14,900 | 17,108 | 13,686 | 5,138 | 14,163 | 12,757 | 11,041 | 1,716 |
| **එකතුව** | **21,391** | **24,918** | **21,326** | **6,171** | **20,204** | **17,285** | **14,703** | **2,579** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර ගණනනාවක සිට පැවත එන හිඟ කඩ කුලී, හිඟ උසාවි දඩ, හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේරුනුවර නගරයේ දිනපතා කසල කිලෝ ග්‍රෑම් 300 ක් පමණ එකතු කරන නමුත් ඒ සඳහා ගාස්තුවක් අයකිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | අවශ්‍ය පියවර අනුගමනය කරමින් ඉදිරියේදී කටයුතු කරන බව | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ අතර පළාත් සභාව විසින් හඳුන්වා දුන් අතුරු ව්‍යවස්ථා 05 ක් වැලඳගෙන තිබුණි. එසේ වුවද වැලඳගත් අතුරු ව්‍යවස්ථා අතර දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම වෙනුවෙන් වූ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ප්‍රවර්ථන වර්ෂය තුළ අයකළ ගාස්තු කිසිවක් නොවීය. | ඉදිරියේදී කටයුතු කරන බව | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව කාර්යයන් අතර ප්‍රධාන කාර්යයන් ලෙසට බල ප්‍රදේශයේ සිදු කරන ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කිරීම සිදු කළ යුතු වුවද 2022 වර්ෂය හා 2023 වර්ෂවලදී පිළිවෙලින් සංවර්ධන බලපත්‍ර 02 ක් හා 03 ක් පමණක් නිකුත් කර තිබුණි. එසේ වුවද සභාවේ අනවසර ඉදිකිරීම් කිසිවක් අනාවරණය කර නොතිබීම නිසා මෙම කාර්යයන් යහපත් අයුරින් නියාමනය වී නොතිබුණි. | අනවසර ඉදිකිරීම් පරීක්ෂා කර අදාළ පරිදි කටයුතු කරන බව | ඉඩම් සංවර්ධන කටයුතු විධිමත් කළ යුතුය. |

3.2 **නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 02/2017 දරණ 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ සේරුවිල ප්‍රාදේශීය සභාවට ලැබුණු හා සභාව විසින් දැනටමත් භාවිත කරනු ලබන රු.41,388,101 ක් වටිනා වාහන 13 | වත්කම් පවරා ගැනීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත. ඉදිරියේදී එම කටයුතු සම්පූර්ණ කර ගැනීමට පියවර ගන්නා බව | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් විගණිත දිනය වන විටද සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සභාව විසින් භුක්ති විඳින වටිනාකම රු.53,412,112 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය ලබා ගැනීමට සියළු කටයුතු කර තිබූ නමුත් අදාළ රජයේ ආයතන වෙතින් පවරා ගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි. | ඉදිරියේදී එම කටයුතු සම්පූර්ණ කර ගැනීමට පියවර ගන්නා බව | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී රු.19,000,000 ක පිරිවැයක් දරා ඉදිකළ ආදාහනාගාරය සමාලෝචිත වර්ෂය තුළද කිසිදු භාවිතයක් නොමැතිව පැවතුණි. ශක්‍යතා අධ්‍යනයකින් තොරව අවශ්‍යතාවය හඳුනා නොගෙන මනාව සැලසුම් නොකිරීම හේතුවෙන් මෙම ආදාහනාගාරය ඌණ උපයෝජිතව පැවතුණි. ආදාහනාගාරයට පිවිසුම් මාර්ගය මෙන්ම අවට ජලයෙන් යටවී පැවතීම හා ආදාහනාගාරයේ දුම්බටය ඉහළ අහසට උස නොවීමත් මත එය භාවිතයෙන් ගිලිහී ගොස් තිබුණි. මෙලෙස ඉදිකිරීම ඉංජිනේරු තාක්ෂණයේ දෝෂයක් මෙන්ම බලප්‍රදේශයේ සිදු කරනු ලබන ඉදිකිරීම් දීර්ඝකාලීන සැලසුමකට අනුව සිදු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. තවද, නවීන ශිල්ප ක්‍රම භාවිතා කර මෙය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ආදාහනාගාරයේ නවීකරණ කටයුතු සඳහා ඇස්තමේන්තුවක් ලබාගැනීමටත්, ඉදිරියේදී එය අළුත්වැඩියාව සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර මූල්‍ය සම්පත් සපයා ගැනීමටත් අවධානය යොමු කරන බව | ඌණ උපයෝජිත වත්කම් ප්‍රයෝජනයට ගත හැකි පරිදි මනාව සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත සේවක මණ්ඩලය හා සත්‍ය වශයෙන්ම සිටින සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 11 ක පුරප්පාඩු 14 ක් පවතින බව අනාවරණය විය. මෙම පුරප්පාඩු | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරදෙන ලෙස ඉල්ලීම් කර ඇති බව | පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| කඩිනමින් පිරවීමට හෝ අනුමත සේවක ප්‍රමාණය නැවත සංශෝධනය කිරීමට හෝ කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණනයන් ස්ථාපිත කර තිබුණ අතර එම කටයුතු ඉටු කිරීම සඳහා සැලසුම් සකස් කර තිබුණි. අභ්‍යන්තර විගණන සැලැස්ම ජාතික විගණන කාර්යාලයෙන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබු අතර සිදුකළ විගණන කාර්යයන් පිළිබඳ වාර්තා ජාතික විගණන කාර්යාලයට ලබාදී නොතිබුණි. | සභාවේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | අභ්‍යන්තර විගණන විධිමත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම්, වියදම් හා තථ්‍ය ආදායම්, වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 04 ක සියයට 9.34 ක සිට සියයට 600.97 ක් දක්වා ද, වියදම් විෂයයන් 03 ක සියයට 19.28 ක සිට සියයට 26.42 ක් දක්වාද විචලනයන් පැවතුණි. | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන කටයුතු කිරීම සඳහා අවධානය යොමු කරන බව | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටළු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට සිදුකළ සංශෝධන ප්‍රකාරව, එකතු කරන ලද කසල වර්ගීකරණය නොකර රැස්කිරීම, ඒවා නිදහසේ මුදා හැරීම, ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය අඛණ්ඩව | ඉදිරියේදී මේ සියළු කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් | ජාතික පරිසර පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිදු නොකිරීම, බල ප්‍රදේශයට සරිලන බැහැර කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම වැනි හේතූන් මත වනසතුන් විසින් කැලිකසල පරිභෝජනය කිරීම හා නොදිරන කසල ප්‍රදේශය පුරා විසිරී පැවතුණි. | අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව | |
| (ආ) | මිනිසුන් විසින් අත්තනෝමතිකව සිදුකරන කසල බැහැර කිරීම් නියාමනය නොකිරීම හා නිසි අනුමැතියකින් තොරව සිදුකරනු ලබන ඉදිකිරීම් සඳහා මැදිහත් නොවීම හේතුවෙන් වැසි සහිත කාලගුණික තත්ත්වයන් වලදී ජලය බැස නොයෑම ආදී කරුණු නිරීක්ෂණය විය. ඉහත කරුණු හේතුවෙන් ඉදිරියේදී බොහෝ පරිසර ගැටළු මතු වීමට ඉඩකඩ පැවතුණි. | මේ පිළිබඳ අවධානය යොමු කර ඉදිරියේදී අවශ්‍ය පරිදි කටයුතු කරන බව | කසල බැහැර කිරීම මනාව නියාමනය කළ යුතුය. |